# පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ

## කොළඹ විශ්වවිද්‍යාලය

2020

## පෙරවදන

කොළඹ විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාලය තුළ සහ අනුබද්ධ ආයතන මගින් සිදු කරනු ලබන පර්යේෂණ, නවෝත්පාදන, නිර්මාණාත්මක හා ශාස්ත්‍රීය කටයුතුවල සංගතභාවය හා අවංකභාවය රඳා පවත්වා ගැනීමට කැපවී සිටියි. පර්යේෂණවල නිරත වන සියලු දෙනාම ඉහළ ප්‍රමිති පවත්වා ගැනීම, පර්යේෂණ සම්බන්ධ සියලු කටයුතුවලදී යහපත් භාවිත අනුගමනය කිරීම, පර්යේෂණවල ගුණාත්මකභාවය හා අවංකභාවය පාරදෘශ්‍ය අයුරින් රඳා පවත්වා ගනු දැකීම විශ්වවිද්‍යාලයේ අපේක්ෂාව වේ. උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් දැනුම නිෂ්පාදනය හා ව්‍යාප්තිය, පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය, සිය යහපත් භාවිත පිළිබඳ දැනුවත් කිරීම හා උපදෙස් දීම හා සිය පර්යේෂණ සංස්කෘතියේ වෘත්තීයභාවය ආරක්ෂා කරගැනීමට විශ්වවිද්‍යාලය බලාපොරොත්තු වේ. මෙසේ කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ මගින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිපත්ති හා භාවිත පිළිබඳ පැහැදිලි හා නිශ්චිත පොදු ප්‍රකාශනයක් සැපයීම අරමුණු කෙරේ.

### දැක්ම

සිය වගකීම් හා ශාස්ත්‍රීය නිදහස තහවුරු කරන අතර දැනුම් නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම කොළඹ විශ්වවිද්‍යාලයේ වැදගත් කාර්යයකි. මෙම කාර්යය ඉටු කිරීමේ අරමුණින් යුතුව කොළඹ විශ්වවිද්‍යාලය පර්යේෂණ කාර්යය සඳහා යෝග්‍ය පරිසරයක් පවත්වා ගන්නා අතර පොදු යහපත උදෙසා දැනුම සොයා යන පර්යේෂණවලට අවශ්‍ය සම්පත් සම්පාදනය කරයි. බුද්ධිමය කුතුහලය උපදවන හා ස්වභාවික හා සාමාජීය ලෝකය ගැන පෘථුල අවබෝධයක් ලබා දෙන සංසිද්ධි පිළිබඳව පර්යේෂණයන්හි නිරත වීමට ශාස්ත්‍රඥයන්ට ඇති අයිතිය විශ්වවිද්‍යාලය විසින් පිළිගන්නා අතර ශාස්ත්‍රීය ප්‍රතිලාභ ලබා නොදෙන පර්යේෂණයන්ට අනුබල දීම හෝ පහසුකම් සැපයීම විශ්වවිද්‍යාලය විසින් සිදු නොකෙරේ.

කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ට තේමා වන ප්‍රධාන කාර්ය හතරකි.

- පර්යේෂණය හා නවෝත්පාදනය
- වාණිජ්‍යකරණය
- ආචාරධර්ම සුරක්ෂණය
- දැනුම බෙදාහැරීම

### පර්යේෂණය හා නවෝත්පාදනය

අ) විශ්වවිද්‍යාලයට සම්බන්ධ හෝ අනුබද්ධ විද්වතුන්ට තමන්ගේම පර්යේෂණ සැලසුම් සකස් කිරීමට, පර්යේෂණ සිදු කිරීමට සහ ඔවුන්ගේ පර්යේෂණවල

සොයාගැනීම් මත පදනම්ව ඔවුන්ගේම නිගමනවලට එළඹීමට නිදහස තිබේ. පර්යේෂණ සඳහා අවශ්‍ය අවකාශය, පහසුකම්, අරමුදල් සහ වෙනත් සම්පත් සැපයීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී. පර්යේෂකයන්ට විශ්වවිද්‍යාලයෙන් ඔවුන්ගේ කාර්යයන් සඳහා සහාය ලබා ගැනීමට සහ එහි අවකාශය, පහසුකම්, අරමුදල් සහ පර්යේෂණ සඳහා අවශ්‍ය වෙනත් සම්පත් භාවිත කිරීමට අයිතියක් ඇත.

ආ) පර්යේෂණය යනුවෙන් නිර්වචනය කෙරෙන්නේ ශාස්ත්‍රීය,නිර්මාණාත්මක සහ පර්යේෂණාත්මක කාර්ය ඔස්සේ යම් මාතෘකාවක් පිළිබඳ විද්‍යාත්මක අවබෝධයක් ලබා ගැනීම සඳහා නව දැනුම නිෂ්පාදනය කිරීම, යෙදවීම සහ බෙදා හැරීමයි. එබැවින් මෙම ප්‍රතිපත්ති රාමුව සම්මානිත මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, අභ්‍යාසලාභීන්, සායනික ආචාර්යවරුන්, ප්‍රථම සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින්, බාහිර කථිකාචාර්යවරුන්, බාහිර පර්යේෂකයන්, වෘත්තීය අනුබද්ධ පුද්ගලයන් සහ පශ්චාත් ආචාර්ය උපාධිධාරීන් යනාදි කොළඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණවල නිරතවන සියලුම සාමාජිකයින්ට අදාළ වේ.

ඉහත සඳහන් පාර්ශ්ව කොළඹ විශ්වවිද්‍යාලයේ මෙම පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට බැඳී සිටින අතර ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම් වාර්තා වුවහොත් ඒවා සම්බන්ධව ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවල විධිවිධාන යටතේ කටයුතු කරනු ඇත. පර්යේෂණයට සම්බන්ධ සියලුම පාර්ශව මෙම පර්යේෂණ ප්‍රතිපත්තියට බැඳී සිටින අතර ප්‍රතිපත්තිය පිළිබඳ නොදැනුවත්භාවය ,සංස්කෘතික නොදැනුවත්භාවය හෝ පෞද්ගලික ගැටලු එය උල්ලංඝනය කිරීමට හේතු ලෙස නොසැලකේ.

ඕනෑම ශාස්ත්‍රීය කටයුත්තක් සම්බන්ධ පර්යේෂණ, නවෝත්පාදන හා හැසිරීමට අදාළ වගකීම් සහ යුතුකම් පහත දැක්වේ:

පර්යේෂණ, නවෝත්පාදන හා නිර්මාණ කටයුතු සඳහා සම්බන්ධ වන විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින් අනිවාර්යයෙන්ම,

අ) පර්යේෂණ අවංකභාවයේ ඉහළම ප්‍රමිති පවත්වා ගත යුතුය.

ආ) පර්යේෂණවලට සම්බන්ධ මානව සහ සත්ව විෂයයන්, ක්ෂේත්‍ර කටයුතු, ජෛව උපද්‍රව, විකිරණශීලී සමස්ථානික සහ පාරිසරික බලපෑම් ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන, සියලුම අංශවලට අදාළ පුහුණුව සහ අනුමැති ලබා ගත යුතුය.

ඇ) අනුමත මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

ඈ) තොරතුරු දැන ගැනීමේ නිදහස, තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත් සහ පර්යේෂණ හා නවෝත්පාදන සම්බන්ධ ආරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ ජාතික හා ආයතනික ප්‍රතිපත්ති පිළිපැදිය යුතුය.

ඉ) ලේඛකයින්, අරමුදල් සම්පාදකයින් / අරමුදල් සපයන ආයතන සහ අනුග්‍රාහකයින් ඇතුළුව සියලුම කතුවරුන්, දායකයින් සහ පර්යේෂණ සඳහා දායකත්වය දක්වන්නන් නිසි පිළිගැනීමට ලක් කළ යුතුය.

ඊ) මෙම පර්යේෂණ ප්‍රතිපත්තියට අදාළ වගකීම්සහගත හැසිරීම ඕනෑම අයුරකින් උල්ලංඝනය කිරීමක් අනාවරණය කළ යුතුය.

උ) විශ්වවිද්‍යාල නිලධාරීන් පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය සහ අධීක්ෂණය සඳහා වගකිවයුතු අතර විශ්වවිද්‍යාලයේ සාමාජිකයන් අතර පර්යේෂණ අඛණ්ඩතාවය දිරිමත් කළ යුතුය.

ඌ) උද්යෝගය සහිත සියලු පාර්ශවවලට ප්‍රවේශ වීමේ නිදහස ඇතුළුව ප්‍රමුඛ මූලධර්මයක් ලෙස පර්යේෂණයේ විවෘතභාවයට අනුගත විය යුතුය. පර්යේෂණ හා නවෝත්පාදනවල ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමේ සීමා ඇතුළුව රහස්‍යභාවය කොළඹ විශ්වවිද්‍යාලය විසින් තහනම් කෙරේ.

එ) විශ්වවිද්‍යාල, ජාතික හා ජාත්‍යන්තර මට්ටම්වල අන්තර්ශික්ෂණ සහයෝගීතා පර්යේෂණ ඇතුළුව පර්යේෂණ හා භාවිත අතර පරතරය පියවා ගැනීම සඳහා සහයෝගීතා පර්යේෂණ දිරිමත් කළ යුතුය.

ඒ) මධ්‍යස්ථාන, පුස්තකාල, ආයතන සහ පුවත්පත් කළමනාකරණය කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති හා රෙගුලාසි පිළිපැදිය යුතුය; දේපල කළමනාකරණය, පර්යේෂණවලින් පසු ඉතිරිය හා අපද්‍රව්‍ය බැහැර කිරීම; අනුග්‍රාහක ව්‍යාපෘති, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති පරිපාලනය, පර්යේෂණ සඳහා සහාය වීම සඳහා කමිටු සහ මණ්ඩල වාර්තා කිරීම සහ පත් කිරීම. [**සියලුම ප්‍රතිපත්ති සහ රෙගුලාසි ලේඛන මීට ඇමිණිය යුතුය]**

## ආචාර ධර්ම සුරක්ෂණය

කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ආචාර ධර්ම පිළිබඳ ප්‍රතිපත්තිය (PORE) මඟින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම, පර්යේෂණ සොයා ගැනීම් සහ දත්ත ප්‍රකාශයට පත් කිරීම යන ක්‍රියාමාර්ග පිළිබඳ මූලධර්ම සඳහා සමස්ත රාමුව සපයයි. මානව හා සත්ව විෂයයන් හා සංවේදී / පුද්ගලික දත්ත සම්බන්ධව විශ්වවිද්‍යාලය තුළ හෝ විශ්වවිද්‍යාලය වෙනුවෙන් පර්යේෂණ කරන කාර්ය මණ්ඩලය, සිසුන් සහ බාහිර බුද්ධිමතුන් ඇතුළු විශ්ව විද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මෙම ප්‍රතිපත්තිය අදාළ වේ. පර්යේෂණ ආචාර ධර්ම පිළිබඳ ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ අරමුණ වන්නේ අවංකභාවය, වගවීම, වෘත්තීයභාවය සහ අධ්‍යයන විශිෂ්ටත්වය සහතික කරන අතරම පර්යේෂණයේ සෑම අංශයකම යහපත් භාවිත ප්‍රවර්ධනය කිරීමයි. මෙම පර්යේෂණ ආචාර ධර්ම ප්‍රතිපත්තිය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ පුද්ගලයන් විසින් යෝජනා කරන ලද හෝ මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාපෘති හා සම්බන්ධව ඇතිවිය හැකි අවදානම් සහ හානි කල්තියා හඳුනාගෙන කළමනාකරණය කිරීමට උපකාරී වේ.

[සටහන: මෙම පර්යේෂණ ආචාර ධර්ම ප්‍රතිපත්තිය වෙනත් අදාළ ප්‍රතිපත්ති, මෙහෙයුම් ක්‍රියා පටිපාටි, භාවිත කේත සහ මෙම විෂයයට අදාළ කොළඹ

විශ්වවිද්‍යාලයේ ඕනෑම රෙගුලාසියක් සමඟ කියවිය යුතුය].

## පර්යේෂණ ආචාර ධර්ම පිළිබඳ ප්‍රතිපත්තිය (සමස්ත විශ්ව විද්‍යාලයටම අදාළ වේ)

### 1. මූලික ප්‍රතිපත්ති

අ) පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුණු විය යුත්තේ පුද්ගලයන්ට, සංවිධානවලට ප්‍රජාවන්ට හෝ සමස්ත සමාජයට උපරිම ප්‍රතිලාභ ලබා දීමයි.

ආ) පර්යේෂකයන් පර්යේෂණ ක්‍රියාවලිය පුරා මානව විෂයයන්ගේ අභිමානය, අයිතිවාසිකම්, ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ දෘෂ්ටියකින් යුතුවීම, ඒවා හඳුනා ගැනීම, ඒවාට ගරු කිරීම හා ඒවා සුරැකීම කළ යුතුය.

ඇ) මානව හා සත්ව විෂයයන් හා සංවේදී / පුද්ගලික දත්ත සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති පර්යේෂණ කටයුතු ඇරඹීමට පෙර අදාළ ආචාර ධර්ම සමාලෝචන කමිටු (ERC) වෙතින් ආචාර ධර්ම නිෂ්කාශනය ලබා ගත යුතුය.

ඈ) පර්යේෂණය සඳහා භාවිත කරන දත්ත / දත්ත සමුදාය නිසිබව හා දෝෂ සහ අතිරික්තවලින් තොර බව පර්යේෂකයන් විසින් සහතික කළ යුතුය. එමෙන්ම ඒවා ප්‍රමාණවත් සහ සවිස්තරාත්මක බවත්, යථාර්ථවාදී සහ විශ්වාසදායක බවත්, ආරක්ෂිතව සහ සුදුසු පරිදි ගබඩා කර ඇති බවත් ප්‍රවේශ විය හැකි බවටත් වගබලා ගත යුතුය.

ඉ) එකතු කරන ලද දත්තවල නිර්නාමිකභාවය සහ රහස්‍යභාවය සහතික කිරීම සඳහා පර්යේෂකයන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

ඊ) පර්යේෂණ ක්‍රියාවලිය සහ ප්‍රමාණවත් පශ්චාත් අධ්‍යයන කාල පරිච්ඡේදයක් තුළ ඵලදායී දත්ත කළමනාකරණය සඳහා පර්යේෂකයන් හැකි සෑම ක්‍රමයක්ම භාවිත කළ යුතුය.

උ) සිදුකරන පර්යේෂණයට අදාළ නියාමන, නෛතික, සමාජ-සංස්කෘතික හා දේශපාලන පරිසරයන් හා පර්යේෂණ සන්දර්භයට අදාළ ප්‍රමිතීන් පර්යේෂකයන් විසින් සලකා බැලිය යුතුය.

### 2. **මූලික වටිනාකම්**

අ) යෝජිත පර්යේෂණ ව්‍යාපෘති නව්‍ය වියයුතු අතර පවත්නා දැනුම් පදනමට අගය එකතු කිරීම සහ අපේක්ෂිත පාර්ශවකරුවන්ට ප්‍රයෝජනවත් වියයුතු වේ.

ආ) පර්යේෂණ අරමුණු, ක්‍රියා පටිපාටි, පවත්වන අන්දම, අපේක්ෂාවන් සහ ප්‍රතිඵල ඇතුළු පර්යේෂණ පිළිබඳ අදාළ සියලු තොරතුරු සහභාගිවන්නන්ට

නිසි පරිදි හෙළි කළ යුතුය.

ඈ) කිසිදු දඬුවමකට යටත් නොවී සහභාගිවන්නන්ට සහභාගීත්වයෙන් ඉවත් වීමට සහ දැනටමත් අනාවරණය කර ඇති තොරතුරු රඳවා ගැනීමට ඇති අයිතිය සහතික කළ යුතුය.

ඇ) සහභාගිවන්නන් සෑහීමට පත් නොවන අවස්ථාවක වැඩිදුර තොරතුරු ලබා ගැනීමට, අදාළ පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට සහ පැමිණිලි කිරීමට සහභාගිවන්නන්ට ඇති අයිතිය සහතික කළ යුතුය.

ඉ) පර්යේෂණ අතරතුර කිසියම් ශාරීරික හෝ මානසික හානියකින් තොරව තමන් ඇතුළු සියලුම සහභාගිවන්නන් ආරක්ෂා කර ගැනීමට හැකි සෑම පියවරක්ම පර්යේෂකයන් විසින් ගනු ලැබිය යුතුය.

ඊ) සියලුම සහභාගිවන්නන් දැනුවත් කර ඔවුන්ගෙන් පර්යේෂණ සඳහා සහභාගී වීමට කැමැත්ත ලබා ගත යුතුය.

උ) ආබාධ සහිත වූවන්, දරුවන්, ශාරීරික හා මානසික රෝග ඇති පුද්ගලයින්, සිරකරුවන්, පුද්ගලයින් පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රැඳවියන් ආදිය අවදානමට ලක්විය හැකි සහභාගී කණ්ඩායම් සමඟ කටයුතු කිරීමේදී විශේෂ සැලකිල්ලක් දැක්වීමට පර්යේෂකයන් වගබලා ගත යුතුය.

ඌ) සියලුම සහභාගිවන්නන්ට කිසිදු අගතියකින් හෝ වෙනස්කමකින් තොරව ගෞරවයෙන් හා සමානාත්මතාවයෙන් සැලකිය යුතුය.

## පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ ප්‍රතිපත්තිය

පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ ප්‍රතිපත්තියේ අරමුණ විශ්වවිද්‍යාලයේ සහ එහි පර්යේෂණ ප්‍රජාවේ අවශ්‍යතා ආරක්ෂා කිරීමයි. ඉන් දැනුම නිෂ්පාදනයේ දියුණුව හා ප්‍රජා සත්කාරය සඳහා කොළඹවිශ්වවිද්‍යාලයේ කැපවීම විධිමත් කරයි. කර්තෘත්වය පිළිගැනීමේදී අදාළ භාවිත අවංක විය යුතුය යි කොළඹ විශ්වවිද්‍යාලය පිළිගනී. කොළඹ විශ්වවිද්‍යාලයේ සහ එහි පර්යේෂණ ප්‍රජාවේ කීර්තිනාමයට එවැනි ක්‍රියාමාර්ග අතිශයින් වැදගත් ය.

මෙම ප්‍රතිපත්තිය කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩලයට සහ උපාධි අපේක්ෂකයින්ට සහ පශ්චාත් උපාධි සිසුන් කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි වැඩසටහනකට අදාළව ඔවුන්ගේ පර්යේෂණ කටයුතු ප්‍රකාශයට පත් කරන විටද, සහ ඕනෑම බාහිර පුද්ගලයකු කොළඹ විශ්වවිද්‍යාලයේ අනුබද්ධව සිදු කරන ලද පර්යේෂණ මත පදනම් වූ ප්‍රකාශනයක්ප්‍රකාශයට පත් කරන විටද අදාළ වේ.

අ) පර්යේෂණ අදහස සංවර්ධනය කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රතිඵල අර්ථ නිරූපණය කිරීම ඇතුළුව පර්යේෂණ කටයුතුවල සැලකිය යුතු කොටසක නිරත වූ සියලු දෙනාම නිසි පිළිගැනීමට ලක් කළ යුතුය.

ආ) පර්යේෂණ ප්‍රකාශනයක කර්තෘත්වය ලබා ගත හැක්කේ එම ප්‍රකාශනයේ සැලකිය යුතු කොටසක කර්තෘත්වය දරන සහ ඊට සැලකිය යුතු බුද්ධිමය දායකත්වයක් ලබා දී ඇති පුද්ගලයෙකුට / පුද්ගලයන්ට පමණි. එකී දායකත්වය මනිනු ලබන්නේ සංකල්පනය, සැලසුම් කිරීම, විශ්ලේෂණය සහ/ හෝ දත්ත අර්ථ නිරූපණය අනුව ය.

ඇ) පර්යේෂණ ප්‍රකාශනවල කතුවරුන් කොළඹ විශ්වවිද්‍යාලයයේ කිසියම් අධ්‍යයන අංශයකට, පීඨයකට, ආයතනයකට හෝ කොළඹ විශ්වවිද්‍යාලයට ඇති සම්බන්ධය පිළිගැනීමට ලක් කළ යුතුය.

ඈ) පර්යේෂණ ප්‍රකාශනවල දී කතුවරුන් සම්මත හා අඛණ්ඩ කතෘ හඳුනාගැනීමක් භාවිත කළ යුතුය.

(ඉ) පර්යේෂණ සිදුකිරීමේදී සහ / හෝ ප්‍රතිඵල වාර්තා කිරීමේදී කිසියම් ලැදියාවන් අතර ගැටුමක් හෝ වෙනත් බලපෑමක් අත්විඳින ලද නම් කතුවරුන් විසින් ඒවා අනාවරණය කළ යුතුය.

(ඊ) වෙනත් පාර්ශවයකින් හෝ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලබාගත් මූල්‍ය හෝ වෙනත් ආධාරයක් කතුවරුන් විසින් නිසි පිළිගැනීමට ලක් කළයුතුය.

උ) විමර්ශිත පර්යේෂණ ලිපි සහ සම්මන්ත්‍රණ පත්‍රිකා වැනි ප්‍රකාශිත පර්යේෂණ ප්‍රතිඵල කතුවරුන් විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ සුරක්ෂිතාගාරයෙහි තැන්පත් කළ යුතුය.

ඌ) කතුවරුන් කොළඹ විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය.

## පර්යේෂණ වාණිජ්‍යකරණය පිළිබඳ ප්‍රතිපත්තිය

කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශක්තීන්ගෙන් එකක් වන්නේ අතිනවීන පර්යේෂණවල යෙදෙන කැපවීමෙන් යුතු , විවිධාකාර හා පරිණත පර්යේෂක කණ්ඩායමයි. එබැවින්, පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම මෙම පර්යේෂණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ මගින් අපේක්ෂා කෙරේ. කොළඹ විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ හා නවෝත්පාදනයන් මත පදනම් වූ ශාස්ත්‍රීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට උත්සාහ කරන අතර පර්යේෂණ ප්‍රතිඵල පොදුජන භාවිතය සඳහා ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා ප්‍රයෝජනවත් නිෂ්පාදන හා සේවා බවට පත් කිරීමට අපේක්ෂා කරයි. විශ්වවිද්‍යාල පර්යේෂණවල ප්‍රතිඵල ලෙස නව නිපැයුම් හා තාක්ෂණය ආරක්ෂා කර වාණිජ්‍යකරණය කළ යුතු බව කොළඹ විශ්වවිද්‍යාලය පිළිගනී. ඉහත සඳහන් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්ව විද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්ත හා ව්‍යාපාර වෙත සම්ප්‍රේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

## කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සම්බන්ධීකාරකයෙහි කාර්යභාරය

ලොව පුරා විශ්වවිද්‍යාල ඔවුන්ගේ සාම්ප්‍රදායික කාර්යයට අමතරව අධ්‍යයන පර්යේෂණ වාණිජ්‍යකරණයේ සුසමාදර්ශී වෙනසක් සිදු කරමින් සිටියි. 2018 දී ආරම්භ කරන ලද විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකාරකය (UBL) කොළඹ විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියට අනුකූලව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිඵල ආරක්ෂා කිරීම සහ වාණිජ්‍යකරණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම ඉහළ නංවයි. කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සම්බන්ධීකාරකය (UBL-UOC) විශ්වවිද්‍යාලයේ තාක්ෂණ හුවමාරු කාර්යාලය ලෙස ක්‍රියා කරයි. විශ්වවිද්‍යාලයේ සංවර්ධිත තාක්‍ෂණය හුවමාරු කිරීමට පහසුකම් සැලසීම, විද්වතුන්ගේ පර්යේෂණ හා සංවර්ධන උත්සාහයන් මගින් නිර්මිත බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සහ විශ්වවිද්‍යාල කර්මාන්ත සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂකයන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

# ශික්ෂණ ක්ෂේත්‍රවලට අදාළ සදාචාරාත්මක සලකා බැලීම්

විවිධ ශික්ෂණ ක්ෂේත්‍රයන්ට අදාළ ආචාරධාර්මික සලකා බැලීම් විශ්වවිද්‍යාලයේ අදාළ පීඨයේ, ආයතනයේ පර්යේෂණ කමිටු (RCs) සහ / හෝ ආචාර ධර්ම සමාලෝචන කමිටු (ERCs) විසින් සලකා බලනු ලැබේ.මේ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සෑම පීඨයක් හෝ ආයතනයක්ම කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ මඟින් සපයනු ලබන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පත් කර, ආචාර ධර්ම මාර්ගෝපදේශ සකස් කර, ආචාර ධර්ම නිෂ්කාශන ක්‍රියාවලියක් හා ක්‍රියා පටිපාටියක් සකස් කර එහි ශික්ෂණ ක්ෂේත්‍රයෙහි ආචාර ධර්ම නිෂ්කාශනයට අදාළ වන ලිපි ලේඛන සකස් කළ යුතු අතර එම ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. ආරම්භක අදියරේදී පර්යේෂණ යෝජනා (ආචාර ධර්ම නිෂ්කාශනය ලබා ගැනීම සඳහා) මෙන්ම ව්‍යාපෘතියේ අවසානයේ ඇති අවසාන පර්යේෂණ ප්‍රතිඵල (ආචාර ධර්ම පිළිපැදීම පරීක්ෂා කිරීම සඳහා) මානව හා සත්ව විෂයයන් හා සංවේදී / පුද්ගලික දත්ත ඇතුළත් වන එක් එක් පීඨයේ හෝ ආයතනයක ආචාර ධර්ම සමාලෝචන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය.

## ශික්ෂණ ක්ෂේත්‍රවලට අදාළ ආචාර විද්‍යාත්මක නිෂ්කාශන

ආචාර ධර්ම නිෂ්කාශනය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් සම්පූර්ණ කර පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පර්යේෂණ යෝජනාව සමග ERC වෙත ඉදිරිපත් කළ යුතුය. ERC නිතිපතා නියමිත වේලාවට ආචාර ධර්ම සමාලෝචන පවත්වා පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රතිපෝෂණය සපයනු ඇත:

අ) පර්යේෂණය නව්‍ය වන අතර ශික්ෂණ ක්ෂේත්‍රයේ පවත්නා දැනුම් පදනමට නව යමක් එක්කරයි.

ආ) පර්යේෂණ ප්‍රතිඵල එහි පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජනවත් වේ.

ඇ) යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පර්යේෂකයෝ සුදුසුකම් ලබති.

ඈ) යෝජනාව නෛතික, මූල්‍ය, වෘත්තීය, ආචාර ධර්ම සහ වෙනත් මාර්ගෝපදේශයන්ට අනුකූල වේ.

(ඉ) පර්යේෂකයින් සහ අනෙකුත් සහභාගිවන්නන්ට සිදුවිය හැකි අවදානම් සහ හානිය අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

(ඊ) පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අපේක්ෂිත පිරිවැය හා අවදානම් ඉක්මවයි.

## පර්යේෂණ ආචාර ධර්ම උල්ලංඝනය කිරීම් වාර්තා කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

පර්යේෂණ ආචාර ධර්ම උල්ලංඝනය කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සහ බලාත්මක කිරීම සිය වෘත්තිකයන් අතර ආචාර ධර්ම වැඩි දියුණු කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ කැපවීම මූර්තිමත් කරයි. මෙම ක්‍රියා පටිපාටි සැලසුම් කර ඇත්තේ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යාම දිරිමත් කිරීම සහ එවැනි උල්ලංඝනයක් සිදුවූ බවට චෝදනා එල්ලවන  අවස්ථාවලදී එවැනි ප්‍රමිතීන් බලාත්මක කිරීම අරමුණු කර ගනිමිනි.

පර්යේෂණ ආචාර ධර්ම උල්ලංඝනය කිරීම් නිසි ලෙස වාර්තා කළ යුතු අතර, පර්යේෂණ ක්‍රියාවලියෙහි සියලු අංගවල ආරක්ෂාව සහතික කිරීමට පියවර ගනු ලැබේ. ඒ ක්‍රියාමාර්ගයට ඇතුළත් වන්නේ:

අ) පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ අනුග්‍රහය යටතේ සමාලෝචන මණ්ඩලයක් පිහිටුවීම එමඟින් පර්යේෂණ ආචාර ධර්ම උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා පරීක්ෂා කිරීම, පැමිණිලි විභාග කිරීම සහ ඒවායේ යෝග්‍යබව තීරණය කිරීම .

ආ) මණ්ඩලයේ සංයුතිය:

I. පීඨයේ පර්යේෂණ කමිටුවේ සාමාජිකයෙක්
II. නීති උපදේශකවරයෙක්
III. ශික්ෂණය පිළිබඳ විෂය විශේෂඥයෙක්
IV. බාහිර සංවිධානයක විෂය විශේෂඥයෙක්

ඇ) වාර්තා කිරීමේ ක්‍රියාවලිය:

නිර්නාමිකභාවය සහ රහස්‍යභාවය: බොරු චෝදනාවක් හේතුවෙන් කීර්තියට සිදුවිය හැකි හානිය නිසා නිර්නාමික චෝදනා කිරීම් තහනම් වේ. කෙසේ වෙතත්, පර්යේෂණ ආචාර ධර්ම උල්ලංඝනය කිරීම වාර්තා කරන පුද්ගලයාගේ අනන්‍යතාවයේ රහසිගතභාවය ආරක්ෂා කළ යුතුය.

ඈ) ආචාර ධර්ම කමිටු තීරණය සහ නියෝග

විමර්ශනයෙන් පසුව, ආචාර ධර්ම සමාලෝචන මණ්ඩලය විසින් විමර්ශන වාර්තාව මත පදනම්ව අදාළ කරුණු හා සොයාගැනීම් ඇතුළත් පරීක්ෂණ සාරාංශයක් සකස් කරනු ඇත. ආචාරධර්ම උල්ලංඝනය කිරීම් පිළිබඳ අවසන් තීන්දුවක් සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ලබා දෙනු ඇත. තීරණයෙහි පිටපත් සහ නියෝග වග උත්තරකරු සහ පැමිණිලිකරු වෙත යවනු ලැබේ.

ඉ) ලේඛන වාර්තා කිරීම:

ආචාර ධර්ම උල්ලංඝනයක් ඇති බව ඔප්පු වී ඇති විට සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. මෙම ක්‍රියාමාර්ගවලදී අදාළ උල්ලංඝනය කිරීමේ බරපතලකම සලකා බලනු ඇත. පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඊට ඇතුළත් වන අතර එහෙත් අදාළ ක්‍රියාමාර්ග මේවාට සීමා නොවේ.

i) අදාළ පර්යේෂකයාගේ/ පර්යේෂකයන්ගේ පුද්ගලික ලිපිගොනුව / ලිපිගොනු වෙත සටහනක් සහිත පෞද්ගලික තරවටු කිරීම

ii) ප්‍රසිද්ධියේ තරවටු කිරීම

(ඊ) නැවත සලකා බැලීමේ හැකියාව: මණ්ඩලය විසින් විභාග කරනු ලබන්නේ ආචාර ධර්ම ප්‍රතිපත්තිය බලාත්මක වී එක් වසරකින් පසුව සිදුවන ආචාර ධර්ම උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තාකිරීම් පමණි.

## ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ආචාර ධර්ම කාර්යාලයක් පිහිටුවීම

පර්යේෂණයන්හි විවෘතභාවය සුරක්ෂිත කිරීම උදෙසා කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් සිදු කරන සියලුම පර්යෂෙණ සොයාගැනීම් පරීක්ෂාව හා විවේචනයන් සඳහා ලබාගත හැකි වියයුතුය.

පර්යේෂණ ක්‍රමවේදය හා අදාළ ශිල්ප ක්‍රම මගින් පර්යේෂණ ආචාරධර්මවල ස්ථාපිත වෘත්තීය සම්මතයන් උල්ලංඝනය නොවිය යුතුය.

මේ අනුව, ආචාර ධර්ම කාර්යාලයක් පිහිටුවීමට සහ ආචාර ධර්ම නිලධාරියෙකු පත් කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයට අයිතියක් ඇත. මෙම කාර්යාලය සියලුම පීඨ හා ආයතනවල ක්‍රියාත්මක වන ආචාර ධර්ම සමාලෝචන කමිටු සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

මෙම කාර්යාලයෙහි අරමුණ වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් සිදු කරන කිසිම පර්යෂෙණයකින් කිසියම් පුද්ගලයකුගේ හෝ ප්‍රජාවක සෞඛ්‍යය, ආරක්ෂාව, පෞද්ගලිකත්වය හා වෙනත් පුද්ගල අයිතීන්ට හානිවීම සහ සතුන්ට

සිදුවන තුවාල හා වේදනා වළක්වා ගැනීමයි.

## පර්යේෂණ දත්ත සහ වාර්තා කළමනාකරණ ප්‍රතිපත්තිය

පර්යේෂණ දත්ත අර්ථ දැක්වෙන්නේ "තර්කයක්, න්‍යායක් හෝ පරීක්ෂණයක් පදනම් වූ කරුණු, නිරීක්ෂණ හෝ අත්දැකීම් වශයෙනි. දත්ත සංඛ්‍යාත්මක, විස්තරාත්මක හෝ දෘශ්‍ය විය හැකිය. දත්ත දළ හෝ විශ්ලේෂිත, පර්යේෂණාත්මක හෝ නිරීක්ෂණ ඒවා විය හැකිය. රසායනාගාර සටහන් පොත්; ක්ෂේත්‍ර සටහන් පොත්; ප්‍රාථමික පර්යේෂණ දත්ත (දෘඪ පිටපත් හෝ පරිගණකගත කියවිය හැකි ආකාර පර්යේෂණ දත්ත ඇතුළුව); ප්‍රශ්නාවලි; ශ්‍රව්‍ය දෘෂ්‍ය පටි; වීඩියෝ දර්ශන; ආකෘති; ඡායාරූප; චිත්‍රපට; පරීක්ෂණ ප්‍රතිචාර දත්ත ගනයට අයත් වේ. පර්යේෂණ එකතුවට විනිවිදක; කෞතුක වස්තු; නිදර්ශක; සාම්පල ඇතුළත් විය හැකිය. දත්ත පිළිබඳ ප්‍රභව තොරතුරුවලට: එය රැස් කළේ කෙසේ ද, කවදා ද, කොතැන ද සහ කොයි ආකාරයෙන් ද (උදා: මෙවලම) යන්න ඇතුළත් විය හැකිය. දත්ත උත්පාදනය කිරීමට, විශ්ලේෂණය කිරීමට හෝ භාවිත කිරීමට භාවිතා කරන මෘදුකාංග කේතය ද ඇතුළත් විය හැකිය " (මෙල්බර්න් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියානු පර්යේෂණ දත්ත පොදු, 2019: 1).

වර්තමානයේ ආයතනික මට්ටමින් පර්යේෂණ දත්ත විධිමත් ලෙස කළමනාකරණය කිරීම හේතු කිහිපයක් නිසා වැදගත් අංගයක් වී තිබේ. එය වෙනත් පර්යේෂකයන්ට දත්ත සොයා ගැනීමට, අර්ථ නිරූපණය කිරීමට සහ නැවත භාවිත කිරීමට හැකියාව ලබා දෙයි. එමඟින් සොයාගැනීම් සත්‍යාපනය කිරීමට හැකි වන අතර එමඟින් දත්තවල වැරදි සිදුවීම හා පිරිසැකසුම් කිරීම් වළක්වා ගත හැකිය. එමගින් දත්ත සමුදා දිගු කාලීනව සංරක්ෂණයට හා ප්‍රවේශ වීමට ද පහසුකම් සපයමින් අරමුදල් සම්පාදනය කරන බලධාරීන්ට ආයෝජන සඳහා ප්‍රතිලාභ ගැන දැනුම සපයයි. එබැවින් අරමුදල් සම්පාදන ආයතන බොහොමයක් විසින් දත්ත කළමනාකරණය ප්‍රසම්පාදන අයදුම්පත්වල අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කර ඇත.

## විෂය පථය

මෙම පර්යේෂණ ප්‍රතිපත්තියේ විෂය පථය කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, සිසුන් සහ අනුබද්ධ ආයතනවල පර්යේෂකයන් විසින් සිදු කරන ලද පර්යේෂණ ආවරණය කරයි.

## ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

අ) වගකිවයුතු නිලධාරියා [ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය විසින් වගකිවයුතු නිලධාරියෙකු පත් කිරීම අවශ්‍ය වේ].

(ආ) ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා [ඉහත හඳුනාගෙන ඇති විෂය පථයට අනුකූලව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය විසින් වගකිවයුතු නිලධාරියෙකු පත් කළ යුතුය]

(ඇ) සමාලෝචනය - මෙම ප්‍රතිපත්තිය සෑම වසර තුනකටම වරක් [හෝ විශ්වවිද්‍යාල බලධාරීන් විසින් තීරණය කරනු ලබන පරිදි] සමාලෝචනය කළ යුතුය.

## ප්‍රතිපත්තිය

## 1.පර්යේෂණ දත්ත සහ වාර්තා කළමනාකරණය

අ) කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, සිසුන් සහ පර්යේෂකයන් විසින් නිර්මාණය කරන ලද පර්යේෂණ දත්ත සහ වාර්තා රටේ, විශ්වවිවිද්‍යාලයේ සහ අරමුදල් සපයන සංවිධානවල නිසි නීති රීතිවලට අනුකූලව හඳුනාගත හැකි පරිදි සහ අවශ්‍ය විටෙක ලබා ගත හැකි පරිදි ආරක්ෂිතව පවත්වාගෙන යන බවට විශ්වවිද්‍යාලය සහතික කළ යුතුය.

(ආ) පර්යේෂණ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු අවම වශයෙන් අවුරුදු පහක් හෝ පර්යේෂකයා විසින් ඊට වැඩි කාලයක් තබා ගත යුතුයයි නිශ්චය කරනු ලබන විට ඊට වැඩි කාලයක් හෝ විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ දත්ත හා වාර්තා රඳවා තබා ගත යුතුය. දත්ත හා වාර්තා බැහැර කිරීම ශ්‍රී ලංකාවේ ජාතික ලේඛනාගාරයේ අදාළ චක්‍රලේඛයට අනුකූල විය යුතුය.

ඇ) පර්යේෂණ දත්ත සහ වාර්තා නඩත්තු කිරීම සඳහා සුදුසු මෘදුකාංග භාවිත කරමින් විශ්වවිද්‍යාලය විසින් දත්ත සුරක්ෂිතාගාරයක් (හෝ සුරක්ෂිතාගාර) පවත්වාගෙන යා යුතුය. [කළමනාකරණය විසින් තීරණය කරන පරිදි සුරක්ෂිතාගාරය මධ්‍යගතව හෝ පීඨ මට්ටමින් පවත්වා ගත හැකිය.]

ඈ)අදාළ සියලු පර්යේෂණ දත්ත වාර්තා කිරීම සඳහා පර්යේෂණ දත්ත සුරක්ෂිතාගාරයට අමතරව විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ දත්ත ලේඛනයක් පවත්වාගෙන යනු ඇත (මෙහි නිශ්චිත රඳවා ගැනීමේ කාලය අවසානයේ දත්ත සුරක්ෂිතාගාරයෙන් ඉවත් කරන ලද දත්තවල වාර්තා අඩංගු වේ. )

## 1.පර්යේෂකයන්

අ) ප්‍රදාන අයදුම්පත සමඟ පහත කරුණු ආවරණය වන පරිදි පර්යේෂකයන් විසින් කෙටි පර්යේෂණ දත්ත කළමනාකරණ සැලැස්මක් (RDM) විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළ යුතුය. එකතු කරන ලද / නිර්මාණය කරන ලද දත්ත වර්ගය; එකතු කිරීමට / නිර්මාණය කිරීමට යොදාගත් ක්‍රමය; ලබා දෙන ලියකියවිලි සහ පාර-දත්ත; ආචාරධාර්මික ගැටලු, ප්‍රකාශන හිමිකම සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් කළමනාකරණය කෙරෙන අන්දම; සහ පර්යේෂණ අතරතුර දත්ත ගබඩාකරණය හා උපස්ථ (back up) කිරීම කෙරෙන අන්දම; දත්තවල ආරක්ෂාව පවත්වා ගන්නා අන්දම; දත්ත වලට ප්‍රවේශ වන ආකාරය කළමනාකරණය කෙරෙන අන්දම; රඳවා ගත යුතු දත්ත මොනවාද සහ කොපමණ කාලයක් රඳවා ගත යුතුද යන්න ; වෙනත් පර්යේෂකයන් සමඟ බෙදාගත යුතු දත්ත මොනවාද යන්න සහ කෙසේද යන්න; දත්ත බෙදා ගැනීම සඳහා සීමාවන් (එනම් රහස්‍ය හෝ පෞද්ගලික) දත්ත); රඳවා ගැනීමේ

කාලපරිච්ඡේදය අවසානයේ දත්ත විනාශ කිරීම සිදු කළ යුතු ආකාරය සහ RDM සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් මොනවාද යන්න

ආ) පර්යේෂකයා හෝ පර්යේෂක කණ්ඩායමක නම් ප්‍රධාන විමර්ශකයා විසින් මේවා සහතික කළ යුතුය;

i) සකස් කරන ලද ලේඛනයට අනුව සහ RDM සැලැස්ම ක්‍රියාත්මක වේ. කිසියම් වෙනස්කමක් සිදු වන සැමවිටම සංශෝධිත RDM සැලැස්මක් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළ යුතුය.

ii) විශ්වවද්‍යාලයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ දත්ත සහ වාර්තා නිවැරදි, සම්පූර්ණ, අව්‍යාජ සහ විශ්වාසදායක ඒවා වියයුතුය.

iii) පර්යේෂණ දත්ත සහ වාර්තා ආපසු ලබා ගත හැකි ආකාරයෙන් ගබඩා කර ඇත.

iv) පර්යේෂණ අවසානයේ දත්ත හා වාර්තා පර්යේෂණ දත්ත සුරක්ෂිතාගාරයේ තැන්පත් කිරීමට විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරනු ලැබේ.

v) ව්‍යාපෘතිය සහයෝගී ව්‍යාපෘතියක් වන විට අවශ්‍ය දත්ත හා වාර්තා සමගාමීව විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරනු ලැබේ.

vi) පුද්ගලික හෝ සංවේදී දත්ත විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමේදී සුදුසු පියවර ගැනීමෙන් දත්තවල රහස්‍යභාවය පවත්වාගෙන යනු ලබයි.

vii) රඳවා තබා ගැනීමේ කාලය අවසානයේ RDM සැලැස්ම අනුව දත්ත සහ වාර්තා විනාශ කෙරේ.

viii) පර්යේෂකයා හෝ ප්‍රධාන විමර්ශකයා පර්යේෂණයෙන් ඉවත්ව යන විට හෝ විශ්වවිද්‍යාලය හැරයාමේදී RDM සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම් භාර ගැනීම සඳහා සුදුසු පුද්ගලයෙකු හෝ පුද්ගලයින් හඳුනාගෙන නම් කරනු ලැබේ.

ix) RDM සැලැස්ම සහ අවසාන දත්ත විශ්වවිද්‍යාල දත්ත ගබඩාවට ඉදිරිපත් කිරීම පිළිබඳව පර්යේෂණ සහායකයින් හෝ සිසුන් දැනුවත් කරනු ලැබේ.

## 1.පීඨාධිපතිවරු සහ අධ්‍යයන අංශ ප්‍රධානවරු

පීඨාධිපතිවරුන් සහ අධ්‍යයන අංශ ප්‍රධානීන් විසින්,

අ) RDM සැලැස්ම සහ විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය පිළිබඳව දැනුවත් වියයුතුය.

ආ) සියලුම පීඨ සාමාජිකයින් සහ පර්යේෂණ සිසුන් අතර RDM සැලැස්ම පිළිබඳ දැනුවත්භාවය ඇති කළයුතුය.

ඇ) ප්‍රදාන අයදුම්පත් සමඟ RDM සැලැස්මක් ඉදිරිපත් කර ඇති බවට තහවුරු කරගත යුතුය.

ඈ) පර්යේෂකයන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද RDM සැලැස්ම හා ප්‍රතිපත්තියට අනුකූල වන බවට සහතික වියයුතුය.

(ඉ) සතුටුදායක යටිතල පහසුකම් සැපයීමෙන් විශ්වවිද්‍යාල දත්ත ගබඩාව නඩත්තු කිරීමට සහාය වීම (පීඨ මට්ටමින් පවත්වා ගෙන යන්නේ නම්)

(ඊ) පර්යේෂණ දත්ත ලේඛනයේ වාර්තා වරින් වර යාවත්කාලීන වන බවට සහතික කරගැනීම

## 1.විශ්වවිද්‍යාල පුස්තකාලය

විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරයා විසින්:

අ) RDM සැලැස්ම සහ විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය පිළිබඳ දැනුවත් වියයුතුය.

ආ) RDM සැලැස්ම පිළිබඳව සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කළයුතුය.

ඇ) සුදුසු මෘදුකාංග භාවිතා කරමින් RDM සැලැස්ම සකස් කිරීමේදී පර්යේෂකයන්ට සහාය වියයුතුය.

ඈ)සුදුසු මෙවලම් හා පුස්තකාලයාධිපතිවරුන්ගේ කුසලතා භාවිත කරමින් (මධ්‍යම හෝ පීඨ මට්ටමේ) පර්යේෂණ දත්ත ගබඩාව සහ මධ්‍යම පර්යේෂණ දත්ත ලේඛනය නඩත්තු කිරීම සඳහා සහාය විය යුතුය.

## දැනුම බෙදාහැරීම

කොළඹ විශ්වවිද්‍යාලය පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම දිරිගන්වමින් ඊට පහසුකම් සපයයි. මේ සඳහා:

අ) ශාස්ත්‍රීය ලේඛනය හා පර්යේෂණ ප්‍රකාශනය පිළිබඳ පුහුණුව හා වැඩමුළු විශ්වවිද්‍යාලය විසින් සපයන අතර තමන්ගේම ඩිජිටල් හා මුද්‍රණ පහසුකම් ස්ථාපිත කරනු ඇත.

ආ) ශ්‍රී ලංකාවේ භාවිත පිළිබඳ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වන නිගමන හා පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට විශ්වවිද්‍යාලය පහසුකම් සහ දිරිගැන්වීම් ලබා දෙනු ඇත.

ඇ) විශ්වවිද්‍යාලය විසින් සිසුන්ට, නවක පර්යේෂකයින්ට සහ කනිෂ්ඨ ආචාර්යවරුන්ට සිය පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සම්පත් සහ උපකාරක සේවා සපයනු ඇත.

ඈ) සිය පර්යේෂණ සොයාගැනීම් විද්වත් ප්‍රේක්ෂකයින් සමග පමණක් නොව සාමාන්‍ය ජනතාව වෙතද බෙදා හැරීමට පර්යේෂකයන් උනන්දු කරනු ලැබේ. අධ්‍යයනයට සහභාගිවන්නන් අතර හෝ ප්‍රතිපත්ති සාරාංශ, පුවත්පත් ලිපි, වීඩියෝ යනාදිය මෙයට සම්බන්ධ වේ.

ඉ) පර්යේෂකයන් (කොළඹ විශ්වවිද්‍යාලයේ සිසුන්, කාර්ය මණ්ඩලය, අනුබද්ධ පර්යේෂකයන්) ඔවුන්ගේ විශ්ලේෂණයන් සහ සොයාගැනීම් ඉදිරිපත් කිරීමේදී ආචාර ධර්ම පිළිපැදිය යුතුය. ඔවුන්ට කීමට හෝ භාවිත කිරීමට අවශ්‍ය දේට සරිලන පරිදි දත්ත හැසිරවීම හෝ "HARKing[1]" වැනි භාවිතයන්ගෙන් වැළකිය යුතුය.

(ඊ) පර්යේෂණ ව්‍යාප්ත කිරීමේදී ස්වයං ලේඛන චෞර අන්තර්ගත ද ඇතුළුව ලේඛන චෞර අන්තර්ගත ඇතුළත් නොවිය යුතුය.

උ) කොල්ලකාරී සඟරා, සම්මන්ත්‍රණ සහ පූර්ව පර්යේෂණයකට සමාන ප්‍රකාශන (Salami publications) පර්යේෂණ ව්‍යාප්ත කිරීමේ පිළිගත හැකි ආකෘති නොවේ. පර්යේෂකයන් මෙම මාර්ගවලින් සිය පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

ඌ) පර්යේෂණ අධීක්ෂණය හෝ අරමුදල් සම්බන්ධව කිසිදු ලැදියා අතර ගැටුමක් නොතිබිය යුතුය. පර්යේෂණයේ දිශානතියට සහ එහි සොයාගැනීම් කෙරෙහි අනවශ්‍ය බලපෑමක් ඇති නොකළ යුතුය.

(එ) වෙනත් ආයතන සඳහා සිදුකරන සහයෝගිතා පර්යේෂණ හෝ පර්යේෂණවල ආරම්භයේ සිටම පර්යේෂණ දැනුම ව්‍යාප්ත කිරීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් විය යුතුය. දත්තවල හිමිකාරිත්වය ද පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන වැනි ආනුභවික නිමැවුම් ගැනද දත්ත මත පදනම්වූ වෙනත් නිමැවුම් ගැනද ඇති කරගන්නා ගිවිසුම් මීට ඇතුළත්ය.

ඒ) දැනුම බෙදාහදා ගැනීමේදී අධ්‍යයනය සඳහා දායක වූ ඕනෑම පාර්ශවයක දායකත්වය පිළිගත යුතුය. පිළිගත් උපුටාගැනීම් සම්මතයනට අනුගත වෙමින් පර්යේෂණයට ලැබුණ ශාස්ත්‍රීය දායකත්වයන් මෙන්ම මූල්‍ය සම්පාදන ප්‍රභව හා පර්යේෂණ සහාය සේවාවන්ගේ ( සංඛ්‍යාන විශ්ලේෂණ, පරිවර්තන වැනි) දායකත්වයන් පිළිගත යුතුය.

ඔ) ශ්‍රී ලංකාව තුළ සිංහල හා දෙමළ පර්යේෂණ ප්‍රකාශන සඳහා සුචිගත වේදිකා නොමැති බැවින් සිංහල/ දෙමළ ශාස්ත්‍රීය පර්යේෂණ ලේඛනයේදී පිළිගත්

[1] 1 (Hypothesizing After the Results are Known). HARKing යනු කිසියම් පර්යේෂණයක ප්‍රතිඵලයකින් ලත් දැනුම මත පදනම් වූ පශ්චාත් උපකල්පිතයක් පූර්ව උපකල්පිතයක් ලෙස ඉදිරිපත් කිරීමයි.

ශාස්ත්‍රීය ලේඛන රටාවකට අනුගත වීමටත්: ප්‍රකාශන ඉදිරිපත් කිරීම නිසියාකාරව සිදු කිරීමටත්, ඒවා දිවයිනේ පිළිගැනීමට ලක්වූ කීර්තිමත් ප්‍රකාශන ආයතනවල ප්‍රකාශනයට පත් කිරීමටත්, ශාස්ත්‍රීය සම-විමර්ශිත සංස්කරණ ක්‍රියාවලියක් අනුගමනය කිරීමටත් වගබලා ගත යුතුය.

ඕ) පර්යේෂකයන් දත්ත සුරක්ෂිත කිරීම, රහස්‍යබව ආරක්ෂා කිරීම හා එකඟවන ලද ගිවිසුම්වලට (NDAs) ගරු කිරීමේ භාවිතයන්ට අනුගත විය යුතුය.

ක) පොදු පරිහරණය උදෙසා හෝ පර්යේෂණ දැනුම බෙදාහදා ගැනීමක් ලෙස දත්ත ඉදිරිපත් කිරීමේදී (උදා: සඟරා හෝ හුවමාරු වේදිකාවලදී) පර්යේෂණයට සහභාගී වූවන්ගේ රහස්‍යබව හා පෞද්ගලිකත්වය ආරක්ෂාවන පරිදි එම ඉදිරිපත් කිරීම් සිදුකළ යුතුය.

ග) පර්යේෂණවලට ප්‍රවේශයන් සැපයීම වඩා පෘථුල දැනුම බෙදා ගැනීමකට හා ඉගෙනුම්, ප්‍රතිපත්ති හා පරිචයන්හිදී වැඩි ප්‍රයෝජනයකට හේතු වේ. සඟරාවේ/ හුවමාරු වේදිකාවේ අව්‍යාජත්වය අනුව පදනම්ව විවෘත ප්‍රවේශය සහිත සඟරාවල ප්‍රකාශන ඉදිරිපත් කිරීම දිරිමත් කෙරේ. පර්යේෂකයන් කොළඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඉ- පර්යේෂණ දත්ත ගබඩාව මගින් හෝ පීඨයේ/ අධ්‍යයන අංශයේ වෙබ් පිටුව තුළින් සිය ප්‍රකාශනවලට ප්‍රවේශ සැපයිය යුතුය (සඟරා කොන්දේසිවලට යටත්ව).

ජ) පර්යේෂණ සංරචකයක් සහිත සියලුම දර්ශනසූරි, දර්ශනපති, විද්‍යාපති හා ශාස්ත්‍රපති උපාධිවල නිබන්ධ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ දත්ත ගබඩාවේ තැන්පත් කළ යුතුය. උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි සහතිකය පිරිනැමීමට පෙර පර්යේෂකයන් කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය විසින් පහසුකම් සපයනු ලබන බුද්ධි චෞරත්ව පරීක්ෂාවකින් පසු සිය නිබන්ධනයේ විද්‍යුත් පිටපත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ දත්ත ගබඩාවට භාරදිය යුතුය. නිබන්ධනය උඩුගත නොකිරීමට හේතු ඇත්නම් (උදා: පේටන්ට් බලපත් අයදුම් කිරීමේ හැකියාව) ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

ට) විශ්වවිද්‍යාල ප්‍රකාශන විද්‍යුත් ගබඩාව නිරන්තරයෙන් යාවත්කාලීන කළ යුතුය සම්මන්ත්‍රණ කටයුතු සහ පිළිගත් සාරාංශ විද්‍යුත් ගබඩාවට උඩුගත කළ යුතුය

ඩ) සෑම වසරකම පර්යේෂණ දීමනා අයදුම්පත් ඉදිරිපත් කරන විට පර්යේෂකයන් පර්යේෂණ සාරාංශය විද්‍යුත් ගබඩාවට උඩුගත කළ යුතුය .එසේම සම්මන්ත්‍රණ කටයුතු ඇතුළුව පර්යේෂණ සාක්ෂිවලට සම්බන්ධ වියහැකි සබැඳියක් සැපයිය යුතුය.

න) පර්යේෂකයන් සෑම විටම ඔවුන්ගේ පර්යේෂණ ඉහළ පිළිගැනීමක් ඇති සඟරාවල පළ කිරීමට උත්සාහ කළ යුතුය. එසේම ඉහළ පිළිගැනීමක් ඇති සඟරා විසින් පිළිගනු ලබන අන්දමට හැකිතාක් නවීන ක්‍රමවේදයන්ට අනුකූලව උසස් තත්ත්වයේ පර්යේෂණ අධ්‍යයනවල නිරත වියයුතුය.

ත) ඉහළ පිළිගැනීමක් ඇති සඟරාවලින් පිළිගනු ලබන පරිදි සාර්ථකව සිය ප්‍රකාශන ප්‍රකාශයට පත් කළ යුතු ආකාරය පිළිබඳ කනිෂ්ඨ පර්යේෂකයන්ට මග පෙන්වීම සඳහා විශ්වවිද්‍යාලය විසින් සෑම ක්ෂේත්‍රයකම ඉහළ පෙළේ පර්යේෂකයන් සම්පත්දායකයින් ලෙස යොදා ගනිමින් වැඩමුළු සංවිධානය කරනු ඇත.

ද) වැදගත් ක්‍රමවේද හා ආචාරධාර්මික ගැටලු සම්බන්ධව ව්‍යාපෘති සමාලෝචකයන්ට සමාලෝචනය කළ හැකි වන පරිදි අධ්‍යයනයට පෙර හෝ අධ්‍යයනය අතරතුර පර්යේෂණ ක්‍රමවේදය ප්‍රකාශයට පත් කිරීමට උසස් තත්ත්වයේ පර්යේෂණ ව්‍යාපෘති අරමුණු කළ යුතුය. මෙය පසුව ඉහළ පිළිගැනීමක් සහිත සඟරාවක ප්‍රකාශයට පත් කළ හැකි උසස් තත්ත්වයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමට දායක වේ.

න) ස්වාධීන ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනවලට ප්‍රවේශ විය හැකි වන පරිදි සෑම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම Researchgate, Publons, Academia.edu හා Google ප්‍රසිද්ධ ගිණුම් (public accounts) තිබිය යුතුය. ORCID හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ද පර්යේෂකයන් දිරිමත් කරනු ලැබේ.

## සංජානනය සහ අගතිය

අ) විශ්වවිද්‍යාල අධ්‍යයන අංශවල ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෝ / වෘත්තීය සගයෝ (colleagues) කනිෂ්ඨ පර්යේෂකයින් / සගයන් විසින් කරන පර්යේෂණ කෙරෙහි අනවශ්‍ය ලෙස බලපෑම් කරති. පර්යේෂණයෙහි සැලකිය යුතු කොටස් කනිෂ්ඨ පර්යේෂකයින් ලවා ඔවුන්ගේ කාර්යභාරය නිසි ලෙස පිළිගැනීමකින් තොරව සිදු කරවා ගැනීම, ඔවුන්ගේ අදහස් අත්පත් කර ගැනීම සහ ඒවා තමන්ගේම ඒවා ලෙස සම්මත කිරීම සහ ඇතැම් විෂය ක්ෂේත්‍රවල පර්යේෂණ සක්‍රියව අධෛර්යමත් කිරීම ආදී ක්‍රියාමෙයට ඇතුළත් වේ. මෙම භාවිත සෘණාත්මක ලෙස හඳුනාගෙන ක්‍රියාශීලීව ඒවා අධෛර්යමත් කළ යුතුය

ආ) කනිෂ්ඨ සගයන් විසින් කරන ලද පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ අවස්ථා තීරණය කිරීමට ජ්‍යෙෂ්ඨ සගයන්ට හැකි අවස්ථාවල, උදා: කුඩා පරිමාණ ප්‍රදාන සඳහා පර්යේෂණ ප්‍රදාන නිර්දේශ කරන කමිටුවල සාමාජිකයන් ලෙස), ඔවුන් විසින් ගනු ලබන තීරණවල විනිවිදභාවය සහ වගවීම තිබිය යුතුය.

ඇ) ජ්‍යෙෂ්ඨ විධායක මට්ටම්වල නිලධාරීන්ගේ හැඟීම් සහ ආකල්ප යෝජිත පර්යේෂණ වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා අනුමත කිරීමේ නිර්ණායක සඳහා පදනම් නොවිය යුතුය. එවැනි අවස්ථාවලදී කොළඹ විශ්වවිද්‍යාලය විසින් පත් කරන ලද ස්වාධීන විශේෂඥ කමිටුවක් හමුවේ සිය යෝජනාව ඉදිරිපත් කර අගයනු ලබන ලෙස ඉල්ලීම මගින් ලැදියා අතර ගැටුම් නිරාකරණය කිරීමට පර්යේෂකයන්ට අයිතිය තිබිය යුතුය.

## කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා නවෝත්පාදන සංවර්ධනය හා වැඩි දියුණු කිරීම සඳහා වන ආයතනික පියවර

අ) මධ්‍යගත කළමනාකරණය:

සියලුම පර්යේෂණ හා නවෝත්පාදන ආශ්‍රිත ක්‍රියාකාරකම් පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය යටතේ විය යුතුය (මෙතැන් සිට CRD ලෙස හැඳින්වේ). කොළඹ විශ්වවිද්‍යාලයේ තරුණ පර්යේෂකයන්ට පුහුණුව ලබා දීමෙන් හා වැඩමුළු සංවිධානය කිරීම මගින් ධාරිතා වර්ධකයෙකු ලෙසද CRD කටයුතු කරයි.

ආ) චින්තන ටැංකියක් ස්ථාපනය කිරීම:

පර්යේෂණ හා පර්යේෂණ වාණිජ්‍යකරණ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකුගෙන්, පර්යේෂණ හා නවෝත්පාදනවලට අදාළ සියලුම මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරුන්, කොළඹ විශ්වවිද්‍යාලයේ, පර්යේෂණ හා නවෝත්පාදනවලට අදාළ සියලුම මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති සහ විශ්වවිද්‍යාලයේ නීති නිලධාරීගෙන් සමන්විත චින්තන ටැංකියක් පිහිටුවීම

ඇ) පර්යේෂණ කමිටු ;

පර්යේෂණ ආචාර ධර්මවලට අනුකූල වීම සහ පර්යේෂණ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම අධීක්ෂණය කිරීම (මට්ටම් දෙකක් අධීක්ෂණය - යෝජනා මට්ටමින් සහ පර්යේෂණයේ හෝ නවෝත්පාදනයේ අවසාන ප්‍රතිඵලය) උදෙසා සියලුම පීඨවල පර්යේෂණ කමිටුවල කාර්යභාරය සහතික කිරීම සහ ශක්තිමත් කිරීම

ඈ) දැනුම ව්‍යාප්ත කිරීම:

කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි සිසුන් විසින් කරනු ලබන පර්යේෂණ ප්‍රකාශන දිරිගැන්වීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය සම්බන්ධ කිරීම

උපග්‍රන්ථ:

අ) පර්යේෂණ හා නවෝත්පාදන සංවර්ධනය සඳහා එක් එක් පීඨය විසින් හඳුනාගෙන ඇති ක්ෂේත්‍ර ලැයිස්තුව

ආ) අරමුදල් සම්පාදකයින්ගේ ලැයිස්තුවක්: සැලසුම් අරමුදල් සම්පාදකයකු ලෙස කො.වි.වි/ අභ්‍යන්තර අරමුදල් / බාහිර අරමුදල්

ඇ) පාර්ශවකරුවන්ගේ ලැයිස්තුවක්

ඈ) අධ්‍යයන අංශ / පීඨ / විශ්වවිද්‍යාල මට්ටම් යටතට ගැනෙන ව්‍යාපෘති සහිත ක්‍රමවත් කාල නියමය

ඉ) අරමුදල් උත්පාදනය හා වියදම් කිරීම පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ ලැයිස්තුවක් / පොදු කාර්ය / පොදු කාර්ය නොවන ප්‍රතිපත්තිය සම්බන්ධව විශ්වවිද්‍යාලයීය කාර්යභාරය / ජාත්‍යන්තර සහයෝගීතා සම්බන්ධව (පීඨයන්හි ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ යොමුව)

(ඊ) විශ්වවිද්‍යාල / දේශීය / ජාත්‍යන්තර මට්ටමින් පර්යේෂණ ප්‍රමුඛතා ලැයිස්තුවක්

උ) වාර්ෂික විශ්වවිද්‍යාල පර්යේෂණ දින දර්ශනය / න්‍යාය පත්‍රය

ඌ) ආචාර ධර්ම නිෂ්කාශනයට අදාළ ලියකියවිලි

එ) කොළඹ විශ්වවිද්‍යාලයේ සවිස්තරාත්මක ආචාර ධර්ම ප්‍රතිපත්තිය

## කොළඹ විශ්වවිද්‍යාලය

# කණ්ඩායම

*ආචාර්ය ජානකී ජයවර්ධන, අධ්‍යක්ෂ, පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, කො.වි.වි.*

*මහා. ෂර්වන්ති හෝමර් වන්නිසිංකම්, පර්යේෂණ හා පර්යයේෂණ වාණිජකරණ ජ්‍යෙෂ්ඨ උපදේශක, කො.වි.වි.*

*ආචාර්ය නිශාන්ත සම්පත් පුංචිහේවා , අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධීකාරකය* (UBL Cell), *නීති පීඨය*

*මහා. ප්‍රියදර්ශනී ගලප්පත්ති, ඖෂධවේදය අධ්‍යයන අංශය, වෛද්‍ය පීඨය*
*මහා. නසීමා කමර්ඩීන්, වාණිජ නීති අධ්‍යයන අංශය, නීති පීඨය*

*මහා. කුමුදුනී දිසානායක, සංවිධාන අධ්‍යයන අධ්‍යයන අංශය , කළමනාකරණ හා මූල්‍ය පීඨය,(ප.උ. අධ්‍යයන පීඨය නියෝජනය කරමින්)*

*මහා. පවිත්‍රා කෛලාසපති, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය , කළමනාකරණ හා මූල්‍ය පීඨය*

*ආචාර්ය කෞෂල්‍යා පෙරේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය*

*මහා. දුෂ්‍යන්ති මෙන්ඩිස්, ඉංග්‍රීසි අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය*

*ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හෙද පීඨය*

*ආචාර්ය ප්‍රදීපා විජේතුංග, පුස්තකාලයාධිපති, කොළඹ විශ්වවිද්‍යාලය.*

*මහා. නිර්මලී පල්ලෙවත්ත, සත්ව විද්‍යා අධ්‍යයන අංශය, විද්‍යා පීඨය.*

*තරුෂිකා පතිරණගේ මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විද්‍යා පීඨය.*

*එම්. ශිෆාර් මයා, සහකාර ලේඛකාධිකාරී , අධ්‍යයන හා ප්‍රකාශන අංශය.*